# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1447 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 09/09/2024
පැය 1100

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.09.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

**02.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 49 | 380 | ප්ලාස්ටික් බූලි 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අනවසරයෙන් කැළණි ගඟේ මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.09.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් කොස්ගම පොලිස් වසමේ හත්දුව වත්ත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අනවසරයෙන් කැළණි ගං ඉවුරේ මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු මැණික් ගැරීමට ගන්නා උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන කොස්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29,39,40 හා 54 වයස් වල පසුවන පුවක්පිටිය හා කොස්ගම යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.** කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාශය**

2024.09.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගොතටුව පොලිස් වසමේ අංගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලි ග්‍රෑම් 250 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගොතටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගොතටුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව දැව කඳන් ඉරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2024.09.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මොණරාගල පොලිස් වසමේ කච්චේරිය පිටුපස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර විවිධ ප්‍රමාණයේ දැව කඳන් ඉරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු දැව කඳන් ඉරීමට යොදා ගන්නා උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන මොණරාගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32,37,43 හා 45 යන වයස් වල පසුවන** මොණරාගල, හුලංදාව හා කුඹුක්කන යන **ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.** මොණරාගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. හඳුනා නොගත් මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර**

2024.09.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රාජාංගනය පොලිස් වසමේ අංගමුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හඳුනා නොගත් මත් කරල් 400 සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාජාංගනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 48 **ක් වූ** යාය 08 **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාජාංගනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුර**

2024.09.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අයියංකුලම් පොලිස් වසමේ අමදිපුරම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ටිපර් රථය සමඟ අත්අඩංගුවට ගෙන අයියංකුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ අක්කරායන් ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.** අයියංකුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**